# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## Police Media Division

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ. අංකය<br>த.பெ.இ<br>P.O. Box No | 517 | | | ෆැක්ස්<br>தொலை நகல்<br>Fax | 011-2329500 |
| දුරකථනය<br>தொலைபேசி<br>Telephone | 011-2384024<br>011-2395605 | වෙබ් ලිපිනය<br>இணைய தளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E mail | dir.media@police.lk |
| මගේ අංකය<br>எனது இல<br>My No | 1049 / 2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2022.07.19<br>පැය 1400 |


## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

### මහජනයා බියවද්දන පිරිස් වලට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීම.

මහජන ආරක්ෂක ආඥාපනත යටතේ වැඩබලන ජනාධිපතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 ජූලි මස 18 වන දින අංක 2289/07 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් හදිසි නීති රෙගුලාසි ප්‍රකාශයට පත් කර ඇත.

එම ගැසට් පත්‍රයේ 15 වන වගන්තිය මඟින් " **මහජනයා බියවැද්දවිය හැකි හෝ මහජනයා කැළඹිය හැකි හෝ වාර්ගික ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකි හෝ වරදක් සිදු කිරීමට පෙළඹවිය හැකි කිසිදු කටකථාවක් හෝ අසත්‍ය ප්‍රකාශයක් හෝ යම් තොරතුරක් හෝ පින්තූරයක් හෝ පණිවුඩයක් කට වචනයෙන් හෝ ඩිජිටල් ක්‍රමයකින් හෝ සමාජ මාධ්‍ය ඇතුළු වෙනත් කවර වූ හෝ ක්‍රමයකින් සන්නිවේදනය කිරීම හෝ පැතිරවීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතුය** " යන්න සඳහන් කර ඇත.

ඩිජිටල් ක්‍රමයකින් හෝ සමාජ මාධ්‍ය ජාලා භාවිතා කරමින් ඉහත වැරදි සිදු කරන පුද්ගලයන්ට එරෙහිව පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් මේ වන විටත් විමර්ශන ආරම්භ කර තිබෙන අතර කුමන ආකාරයකින් හෝ සන්නිවේදනය කරමින් ඉහත වැරදි සිදු කරන පුද්ගලයන්ට එරෙහිව දිවයිනේ ඕනෑම පොලිස් ස්ථානයක් මඟින් හෝ විමර්ශන කොට්ඨාසයක් මඟින් හෝ ඒකකයක් මඟින් විමර්ශන කටයුතු සිදු කරනු ලබන අතර එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාල වන වෙනත් නීති මඟින් මෙන්ම ගැසට් පත්‍රයේ බලතල ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කරනු ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**